පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
11

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- චිත්‍ර කලාව I ,

පාසලේ නම : ......................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..........................

**කාලය පැය 01 යි**

❖ සියලුම ප්‍රශ්න වලට **මෙම පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

- පහත දැක්වෙන ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



1. ගෘහ නිර්මාණ ශිල්පයේ සුවිශේෂ නිර්මාණයක් වන මෙය .................................................................................. නමින් හැඳින්වේ.
2. මෙම ගෘහ නිර්මාණය ....................................................................................................................................... යුගයේ දී ඉදි වූවකි.
3. මෙය ..................................................................................................................................................... රජතුමා විසින් ඉදි කරවන ලද්දකි.
4. මෙහි කුලුනු නිර්මාණය සඳහා ..........................................................................ශාකයේ අංග රිද්මයානුකූලව භාවිතා කර ඇත.
5. මෙය ................................................................................................................. වැනි කටයුතු සඳහා භාවිතා කර ඇති බව සඳහන් වේ.

- අංක **6** සිට **10** තෙක් ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

6. ජී.එස්. ප්‍රනාන්දු ශිල්පියාගේ "උළු පෝරණුව" නම් සිතුවම නිර්මාණය කිරීමට භාවිතා කළ මාධ්‍යය කුමක්ද?............................
7. මානව හා සත්ත්ව රූපවල කොටස් මැනවින් සංරචනය කර ඇති පිකාසෝගේ සිතුවමේ නම කුමක්ද? ..................................
8. පොළොන්නරු ගල් විහාරයේ අභ්‍යන්තරයට හාරා සකස් කළ ගුහාව කුමන නමකින් හැඳින්වේද.?............................................
9. ද්විතීයික වර්ණයක්වන රඹ පාට සාදා ගැනීම සඳහා රතු වර්ණයට එක් කළ යුතු වර්ණය කුමක්ද?............................................
10. ඇතකුගේ හා ගොනකුගේ හිස එකට සම්පිණ්ඩනය වන සේ නිර්මාණය කළ සැරසිල්ල කුමක්ද ? ..........................................

.

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා ඊට යටින් ඉරක් අඳින්න.

11. ශ්‍රී ලංකාවේ කාටූන් චිත්‍ර කලාවේ පුරෝගාමී ශිල්පියා වන්නේ,

    (1) ඩබ්. ආර්. විජේසෝම (2) ජෙෆරි යූනුස්

    (3) කැමිලස් පෙරේරා (4) ඔබ්රි කොලට්

12. හෙන්රි මුවර්ගේ නිර්මාණයක් වන වැතිර සිටින ආකාරයක් දක්වෙන මූර්තියේ,

    (1) වියුක්ත හැඩ දක්නට ලැබේ. (2) තාත්වික හැඩ දක්නට ලැබේ.

    (3) ස්වභාවික හැඩ දක්නට ලැබේ. (4) සංකීර්ණ හැඩ දක්නට ලැබේ.

13. සීගිරි සිතුවම්වලින් අප්සරාවන් නිරූපණය වන බවට මතයක් ඉදිරිපත් කර ඇත්තේ,

    (1) සෙනරත් පරණවිතාන මහතා. (2) එච්. සී. පී. බෙල් මහතා.

    (3) ආනන්ද කුමරස්වාමි මහතා.. (4) ඊ. පී. දූරණියගල මහතා.

14. ඉන්දියාවේ සාරානාත් ප්‍රදේශයෙන් හමු වූ ගුප්ත යුගයේ නිමවූ සාරානාත් පිළිමයේ දෑතින්.

    (1) භූමි ස්පර්ශ මුද්‍රාව නිරූපණයවේ. (2) ධම්මචක්ක මුද්‍රාව නිරූපණයවේ.

    (3) විතර්ක මුද්‍රාව නිරූපණයවේ. (4) ධ්‍යාන මුද්‍රාව නිරූපණයවේ.

15. රෆායල් ශිල්පියාගේ ඇතැන්ස්හි ගුරුකුලය සිතුවම දක්නට ලැබෙන්නේ

    (1) රෝමයේ ස්ටැන්සා ඩෙලා සිගන්චුරා ගොඩනැගිල්ලේ බිත්තියක. (2) ශාන්ත පීතර දෙව් මැදුරේ,

    (3) රෝමයේ සිස්ටයින් දෙව් මැදුරේ, (4) වියානාවල කලා කෞතුකාගාරයේ,

- අංක **26** සිට **30** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ **සම්පූර්ණ** වාක්‍යය බැගින් ලියන්න.

16. කිහිඹි මුහුණ. -:..............................................................................................................................................
    :..............................................................................................................................................

17. මස්ජිදය :..............................................................................................................................................
    :..............................................................................................................................................

18. යූපය :..............................................................................................................................................
    :..............................................................................................................................................

19. අල්ලියාදු :..............................................................................................................................................
    :..............................................................................................................................................

20. පත්තිරිප්පුව :..............................................................................................................................................
    :..............................................................................................................................................

- අංක **21** සිට **25** තෙක් දී ඇති රූප සටහන් කොටස් වලට සමීප සබඳතාවක් දක්වන රූප සටහන ඉදිරියේ ඇති A,B,C,D,E යන ඒවා අතුරෙන් තෝරා එහි අක්ෂරය තිත් ඉරි මත ලියන්න.

21.  (,..............)  A

22.  (,..............)  B

23.  (,..............)  C

24.  (,..............)  D

25.  (,..............)  E

- අංක **26** සිට **30** තෙක් දී ඇති වැකිවල හිස්තැනට වඩාත් සුදුසු වචනය යොදා සම්පූර්ණ කරන්න.

26. පොළොන්නරු යුගයට අයත්වන පොත්ගුල් විහාර ප්‍රතිමාව ................................................................ ඉරියව්වෙන් නෙළා ඇත.

27. කතළුව විහාරයේ සිතුවම්වල පසුබිමෙන් දක්වෙන ගොඩනැගිලි .............................................. ලක්ෂණයන්ගෙන් යුක්ත වේ.

28. බුදුන් වහන්සේ කිඹුල්වත් පුරයට වැඩම කිරීම චිත්‍රය අජන්තාවේ අංක .................................................... ලෙනෙහි දැකිය හැක.

29. හින්දු ආගමික මූර්තියක්වන සුන්දරමූර්තිස්වාමි ප්‍රතිමාව වර්තමානයේ ........................................................... ප්‍රදර්ශනය කෙරේ.

30. කොළඹ රාජකීය විද්‍යාලයේ නව රඟහලේ ඇති උන්නත කැටයම ........................... මාධ්‍ය භාවිතයෙන් නිර්මාණය කර ඇත.

- අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට F,G,H,I,J යන රූපසටහන් ඇසුරෙන් පිළිතුරු සපයන්න.


F


G


H


I


J

31. F අක්ෂරයෙන් දැක්වෙන ප්‍රතිමාවේ උෂ්ණීෂය මත දක්නට ඇති අංගය කිනම් නමකින් හැඳින්වේ ද? ......................................

32. G අක්ෂරයෙන් දැක්වෙන පොත් පිටකවරය නිර්මාණය කළ දමිළ ජාතික ශිල්පියා කවුද?..........................................................

33. H අක්ෂරයෙන් දැක්වෙන සිතුවම් කොටස උපුටාගෙන ඇති සිතුවමේ නම කුමක්ද? ........................................................................

34. I අක්ෂරයෙන් දැක්වෙන තොරණ දක්නට ලැබෙන්නේ කුමන ස්තූපයක් අසලද ? ........................................................................

35. J අක්ෂරයෙන් දැක්වෙන ඇම්බැක්කේ දේවාලයේ ඇති ලී කැටයම නෙළා ඇති ශිල්ප ක්‍රමය හඳුන්වන්න. ?.............................

- මෙහි දැක්වෙන නිර්මාණය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට 40 තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් සම්පූර්ණ වාක්‍යය **පහක්** ලියන්න. (තනි වචනයෙන් පිළිතුරු සැපයීම ලකුණු නොලැබීමට හේතුවක් වනු ඇත.)



36. ශිල්පියා පිළිබඳවඃ- ..........................................................................................................................................

..........................................................................................................................................

37. ස්ථානය පිළිබඳව ඃ- ,..........................................................................................................................................

..........................................................................................................................................

38. නිරූපිත තේමාව පිළිබඳවඃ-..........................................................................................................................................

..........................................................................................................................................

39. අභාසය පිළිබඳවඃ- ..........................................................................................................................................

..........................................................................................................................................

40. සංරචනය කර ඇති අයුරු ඃ- ..........................................................................................................................................

..........................................................................................................................................

( ලකුණු 40)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- චිත්‍ර - II,

පාසලේ නම : ........................................

ඇතුළත්වීමේ අංකය : ..............................

**කාලය පැය 02යි**

සැලකිය යුතුයි.

- ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට ද්‍රව මාධ්‍ය භාවිතා කරන සිතුවම් වියළී තිබිය යුතුය. තෙත චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
- දියසායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.
- ද්‍රව්‍ය සමූහය 73cm පමණ උස පැතැලි ඩෙස්ක් එකක් මත තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

---

## ❖ නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය.

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති A 4 ප්‍රමාණයේ සුදු කඩදාසිය භාවිතා කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර කඩදාසිය භාවිතා කරන්න.

- **ඉහත 1 සහ 2 චිත්‍ර දෙක ම එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.**
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

❖ **නිදහස් රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව රේඛා අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා (ලකුණු 05)

❖ **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය කිරීම. (ලකුණු 05)
3. පරිමාණ, පර්යාවලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය. (ලකුණු 05)
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගති ලක්ෂණ දැක්වීම. (ලකුණු 05)
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා (ලකුණු 05)
6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව (ලකුණු 05)

සැලකිය යුතුයි

- ද්‍රව්‍ය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- චිත්‍ර කලාව - II,


පාසලේ නම : ........................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය පැය 02 යි.

චිත්‍ර විෂය භාර ගුරුභවතුන් සඳහා පමණි.

## ද්‍රව්‍ය සමූහයේ සැලැස්ම



- **අවශ්‍ය ද්‍රව්‍යය :-**

1. අරලිය ඉත්තක්, (කොළ 5 ක)
2. වර්ණවත් රෙද්දක්,
3, සුදු කඩදාසිවලින් ආවරණය කළ 23 cm 23 cm 12 cm පමණ ප්‍රමාණයේ පෙට්ටියක්,
4. අඟල් 5ක් පමණ විෂ්කම්භය ඇති වීදුරු දීසියක්
5. අඟල් 12ක් පමණ උස මැටි කළයක්,

(ලකුණු 30)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
| --- |
| 11 |

# අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- චිත්‍ර කලාව - 111

පාසලේ නම : ..............................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලයː පැය 02 යි.

**උපදෙස්ː**

- ඔබ ඇඳිය යුත්තේ **එක්** චිත්‍රයක් පමණි.
- ඔබේ **විභාග අංකය හා අදාළ ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලිව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට ද්‍රව මාධ්‍ය භාවිතා කරන සිතුවම් වියළී තිබිය යුතුය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකිය.
- දියසායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිතා කළ හැකිය.
- චිත්‍ර ඇඳීමේ විශේෂ කඩදාසි හා අවශ්‍ය අයට ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

---

"අ" කොටස "ආ" කොටස හෝ "ඉ" කොටසින් එක් මාතෘකාවක් පමණක් තෝරා ගන්න.

**"අ" කොටස - චිත්‍ර සංරචනය.**

1. වැවක දිය නාමින් විනෝදවන පිරිසක්,

2. සිරිපා කරුණා කරන බැතිමතුන්,

3. නගරයක පවත්වන ඉරිදා පොළක අවස්ථාවක්,

4. හේනකට කඩා වැදුණු අලි රංචුවක්,

**"ආ" කොටස - මෝස්තර නිර්මාණ.**

5. පැති අටක් වූ කුඩ රෙද්දක් සඳහා වර්ණවත් විසිතුරු මෝස්තරයක් නිර්මාණය කරන්න.

6. බිත්ති මුද්‍රණය සඳහා යොදා ගැනීමට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක අඟල් 9 x 9 ප්‍රමාණයේ කොටසක් නිර්මාණාත්මක මල්, කොළ, ඇසුරෙන් නිර්මාණය කරන්න. ව්‍යාප්ත වන ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.

7. මැටි බඳුනක් අලංකාර කිරීම සඳහා සාම්ප්‍රදායික සැරසිලි ඒකක ඇසුරෙන් සැරසිල්ලක් නිර්මාණය කරන්න. සුදුසු වර්ණ භාවිතා කරන්න.

**"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර.**

8. ''පාරම්පරික වෙස්මුහුණු කලාව'' නමින් පළ කෙරෙන ග්‍රන්ථයකට සුදුසු පිටකවරයක් නිර්මාණය කරන්න. .

9. දේශීය නිෂ්පාදනයක ඇසුරුම සඳහා සුදුසු වර්ණවත් ලේබලයක් සැලසුම් කරන්න.

10. ''සරු බිමයි ගොවි දැතයි'' යන මැයෙන් හරවත් පෝස්ටර් සිතුවමක් නිර්මාණය කරන්න.

(ලකුණු 30)

2022 අවසාන වාර පරීක්ෂණය
11 ශ්‍රේණිය චිත්‍ර කලාව
I පත්‍රය පිළිතුරු

01. නිශ්ශංක ලතා මණ්ඩපය
02. පොළොන්නරු
03. නිශ්ශංකමල්ල
04. නෙළුම්
05. ධර්මය ශ්‍රවණය කිරීම/දළදා වන්දනය/පිරිත් ශ්‍රවණය කිරීම
06. දිය සායම්
07. ගුවර්නිකා
08. විද්‍යාධර ගුහාව
09. කහ
10. වෘෂභ කුඤ්ඤරය
11. (4) ඔබ්රි කොලට්
12. (1) වියුක්ත හැඩ දක්නට ලැබේ. .
13. (3) ආනන්ද කුමරස්වාමි මහතා..
14. (2) ධම්මචක්ක මුද්‍රාව නිරූපණයවේ.
15. (1) රෝමයේ ස්ටැන්සා ඩෙලා සිගන්චුරා ගොඩනැගිල්ලේ බිත්තියක.
 (අංක 16 සිට 20 දක්වා දී ඇති වචනයේ අර්ථය පැහැදිලි වනසේ පිළිතුරු ලියා ඇති නම් ලකුණු ලබා දෙන්න.)
16. මකර තොරණ ආරම්භ වන්නේ කිහිඹි මුහුණෙන්ය./කීර්ති මුඛ යනුවෙන්ද හඳුන්වයි.
17. ස්ලාම් දේවස්ථාන හැඳින්වෙන නමකි.
18. සාංචි ස්තූපයේ හර්මිකාව මැද ඇති ගල් ටැඹ යූපය නමින් හැඳින්වේ.
19. වෙස් මුහුණු වර්ණ කිරීමේ දී ප්‍රථමයෙන් තවරන සුදු පැහැති ආලේපයකි.
20. මහනුවර දළදා මාළිගාවේ ඇති සුවිශේෂි ගෘහ නිර්මාණ අංගය වේ.
21. D
22. A
23. E
24. B
25. C
26. ත්‍රිභංග
27. යුරෝපීය
28. 17
29. කොළඹ ජාතික කෞතුකාගාරයේ
30. ටෙරාකොටා
31. සිරස්පත
32. වෛතීසවරම් සිවසුබ්‍රමනියම් (රමණි)
33. දේවාරාධනාව
34. සාංචි
35. අල්ප උන්නත
36. ඩේවිඩ් පේන්ටර් ශිල්පියා විසින් අඳින ලද සිතුවමකි.
37. මෙම සිතුවම මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ ඇඳ ඇත.
38. යහපත් සමරිතානුවරයා පිහිටවන ආකාරය මෙම චිත්‍රයෙන් නිරූපණය කර ඇත.
39. යුරෝපීය ශාස්ත්‍රාලීය චිත්‍ර කලාවේ ස්වභාවිකවාදී කලා ආභාසය දක්නට ලැබීම.
40. සිතුවමේ ගැඹුර නිරූපණය කරන පර්යාවලෝක ලක්ෂණ, ත්‍රිමාණ ලක්ෂණ දක්වමින් සංරචනය කිරීම./ ශ්‍රී ලාංකීය භූ තල, සමාජ පසුබිම, ඇඳුම් පැලඳුම්, නිරූපණය කර තිබීම.


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න